


# චිත්‍රලතාගේ කතාව



දඩ - බඩාස් ...... !

මොකක්ද ඒ සද්දේ ? පින්ගේ කාමරෙන් ඇහුණෙ.

පන්හිඳයි, පැන්සලයි, පින්සලගේ කාමරේ දිහාට දුවගෙන ගියා. පින් කාමරේ මැද්දෙ බිම වැටිලා. ඩෙනිම් කලිසමකුත් පටලවගෙන.

"මේ මොකද මේ?"
"මං මේ කලිසං කකුලට කකුල දැම්මා. කකුල ගියේ කලිසං කකුල දිගේ නෙවේ. වෙන කොහේද. " පින් කෙඳිරි ග ගා නැගිට්ටින්න හැදුවා.

"කොහොම ද මේ අලුත්ම ඩෙනිම් කලිසමේ කකුල ඉරුණෙ ?" පන් ඇහුවා. කකුල ඉරුණ තැනින් පින්ගේ කකුල එළියට ඇවිත්. පින්ට කකුල කලිසමේ පැටළිලා වාරු නැතුවයි වැටිලා තියෙන්නෙ.

"මේක ඉරිලා නෙවි. මේ අලුත්ම මෝස්තරේනේ. ඩෙනිම් කලිසං වල අතනින් මෙතනින් කවුලු තියන එක දැන් මෝස්තරේ ..." පැන් පින්ගේ කකුල මේ පටලැවිල්ලෙන් බේරන ගමන් පන්ට පැහැදිලි කලා වෙලා තියෙන දේ."

"මේ නහින දෙහින කාලෙ ජැන්ඩියට ඇඳගෙන කොහෙ යන්න ද මේ උදේ පාන්දර ම ?"
"එකෙන් වැඩක් නෑ; මට තමුන්නැහෙගේ "අයි ෆෝන්" එක දෙනව ද?" පින් ගෙ කෙඳිරිල්ල හොඳා වාගේ.

"කොහෙද යන්නෙ කිව්වොත් දෙන්න පුළුවං. අයි ෆෝන් එහෙම අරගෙන මොන විගඩමක් නටන්න හදනවද කවුද දන්නෙ ?"

"චිත්‍රලතා ව මුණ ගැහෙන්න ද .......!" පින් හඬ පොඩ්ඩක් බාල කළා.
"අපේ පංතියෙ උන්නු චිත්‍රලතා ...?" පැන් ට හරි පුදුමයි.

"උන්දැත් දැන් මෙහෙ ද?" පන්හිඳත් උනන්දුයි.

"චිත්‍රලතා මෙහෙ මොනවද කරන්නෙ ...? පැන් ආයෙමත්.

"කියන්නං, කියන්නං. මගේ ඇපොයින්මන්ට් එකට වේලාවත් හරි. ගිහින් ඇවිත් විස්තර කියන්නං. චිත්‍රලතා දැන් මෙහෙ මොඩල් කෙනෙක්. හැබැයි මෝස්තර නිරූපිකාවක් නෙවි. ආර්ටිස්ට්ලා ප්‍රැක්ටිස් කරන ස්ටුඩියෝ එකක මොඩල් එකක් !"

"ඒ කියන්නෙ චිත්‍ර ශිල්පියො අඳින්න පුහුණුවෙන චිත්‍රාගාරයක නිරූපිකාවක් ?" පන් ශුද්ධ සිංහලෙන් ආයෙත් ඇහුවා.
"ඔව්, ඔව් මටත් එයැයි ව මුණගැහුණෙ එහෙම තැනක දි. අද මේ යන්නෙ පොඩි සම්මුඛ සාකච්ඡාවක් කරන්න "සන්නස" පත්තරේට.

"ගුටි කන වැඩක්" පන් කිව්වා.
"මගේ ෆෝන් එකත් නැතිවෙන වැඩක්" පැන් කිව්වා
"කිව්වා නාහන ගුරු ඔහේ ගියාවේ ..!"

පින් වෙලාවට චිත්‍රලතාව මුණගැහුණා ආපන ශාලාවකදි.

"කොහොම ද චිත්‍රලතා ඉතින් ?"
"මට චිත්‍රා කියලා කියන්න. වරදක් නෑ. ඔයාට කොහොම ද?"
"හොඳයි. අපි ඉතින් කතාවට බහිමු."

"සිංහල පත්තරේකට මේ වැඩේ ගැලපෙයි ද?" චිත්‍රා ඇහුවා.
"බලමු වැරදි දෙයක් සමාජයට දෙන්නෙ නැත්තම් ප්‍රශ්ණයක් වෙන එකක් නෑ මං හිතන්නෙ. අනික මේකත් කලාවක්නේ ......"

"චිත්‍රා කොහොමද මේ රැකියාවට යොමුවුණේ ?" පින් මුලපිරුවා.

"ඇත්තට ම මම මෙහාට මුලින්ම ආවෙ ඉගෙන ගන්න. ඒ කටයුතු කරගෙන යනකොට මම ඉල්ලපු එක පාඨමාලාවකට මාව තෝරාගත්තා වැඩි දුර අධ්‍යාපනයට. ඇත්තටම ඒක කලාතුරකින් ලැබෙන අවස්ථාවක්. ඒත් ඉතින් මට විය හියදම් අතින් ප්‍රශ්ණ තිබුණා. ඔය ගැන මම මෙහේ සුදු ජාතික මිතුරියකට කිව්වම තමයි මේ විදිහේ දෙයක් රස්සාවක් හැටියට කරන්න කැමතිද කියලා මගෙන් එයා ඇහුවෙ. ඇත්තටම එයා චිත්‍ර ඇඳීම විෂයක් විදියට ඉගෙන ගන්න කෙනෙක්. එයාලා පුහුණුවෙන කලාගාරයේ නිරූපිකාවකට පුරප්පාඩුවක් තියෙන නිසා ඒකට උත්සාහ කරමු කියලා කිව්වා."

"අමුත්තක්, බයක්, ලැජ්ජාවක් හිතුණෙ නැද්ද" පින් හරස් ප්‍රශ්ණයක් ඇහුවා."

"ඇත්තටම ඔව්. ඔය ඔක්කොම දේවල් එකට එකතුවුණ දෙයකින් මං ඒ කතාව අහපු වෙලාවේ තිගැස්සුණා. ඒත් මගේ සුදු යෙහෙළිය මට කරුණු පහදලා දීලා මගේ බය, ලැජ්ජාව තුනී කලා. මගේ රූපය, උස " මහත, අඟ පසඟ ඒ වාගේ රැකියාවකට ගැලපෙන බව කිව්වා. ඒ වගේ ම මෙහේ සුදු අය ඒක සළකන්නේ තවත් රස්සාවක් හැටියට මිසක් වැර දෙයක් විදියට නෙවෙයි කියලාත් කිව්වා. මුල් කාලයේ එයත් එක්කම යන්න පුළුවන් නිසා බය වෙන්න දෙයක් නැති බවත් කිව්වා. පූර්ණ කාලීන රැකියාවක් නොවෙන නිසා මගේ අධ්‍යාපනයට බාධාවක් නොවෙන නිසාත්, හොඳ ආදායමක් ලැබෙන නිසාත් ඒ රැකියාවට ඉල්ලුම් කරන්න කියලා ඇය මාව උනන්දු කළා. ඉතින් මම ඉල්ලුම් කළා."

"ඉතින්...?"

"ඇත්තටම අර මගේ යෙහෙළිය කියපු දේවල් තමයි මාව රස්සාවට තෝරගන්න සුදුසුකම් වුණේ. වෙලාවල් ගැලපුණ එකත් මට වාසි

MIGRATE TO AUSTRALIA
MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES
The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
• Graduate skilled visa
• Student visa renewal
• Change visa subclass
• Family sponsored visa
• Skills assessments
• Change course provider
• Partner visa
• MRT (Review application)

OFFSHORE
• Skilled visa
• Student visa
• Visit visa
• In house IELTS
• Business visa
• Spouse visa
• Parent visa
• Appeals

Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms

Meet our qualified consultants with years of experience who can deliver the results
Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.
Consultation by Appointment only
Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au
MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA
MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696